E-NB
Academics
24/6

# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## උපකුලපති තනතුර සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවීම.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තියේ සහ එහි තදනන්තර සංශෝධනවල ද 2006 අගෝස්තු මස 15 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 880 දරන චක්‍රලේඛය හා එහි තදනන්තර සංශෝධනවල ද නියමයන් ප්‍රකාරව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින්, විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා පුද්ගලයින්ගේ අයදුම්පත්/ නාමයෝජනා කැඳවනු ලැබේ.

ඔහු/ඇ විසින් සිය ධුරය අදාළ කාලසීමාවට පෙරාතුව අත්හැර දමන්නේනම් හෝ සංශෝධිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ නියමයන් ප්‍රකාරව ධුරයෙන් ඉවත්කරනු ලැබුවහොත් මිස, වසර තුනක කාලසීමාවක් සඳහා හෝ සිය හැටපස් වන වසර සපිරෙන දිනය හෝ යන දෙකින් ප්‍රථමයෙන් එළැඹෙන දිනය දක්වා උපකුලපතිවරයෙකු විසින් සිය ධුරය දැරිය යුතුය.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව, උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙකු වේ. ඔහු / ඇ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියාද, ප්‍රධාන අධ්‍යයන නිලධාරියාද, ගණන් දීමේ නිලධාරියාද වේ. ඔහු / ඇ පාලක මණ්ඩලය හා සනාතන සභාව යන ආයතන දෙකෙහිම නිලබලයෙන් සාමාජිකයෙකු හා සභාපතිවරයාද වේ. අධ්‍යයන නායකත්වය සැපයීම, කළමනාකරණ ප්‍රතිපත්ති සකස්කිරීම, මෙහෙයවීම හා හඳුන්වාදීම, පාලක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හා විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් උපකුලපතිවරයා විසින් වගකිව යුතු බැවින්, ඔහු / ඇ අධ්‍යයන විශිෂ්ඨත්වය පාරදෘශ්‍යභාවය, වගකීම, ප්‍රජාතන්ත්‍රීය කළමනාකරණය හා සඵල අපක්ෂපාතී නායකත්ව මූලධර්ම උත්ථම්බනය කරනු ලැබිය යුතුයි.

ප්‍රබල පර්යේෂණ පැතිකඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමග වාස්තවිකව ගනුදෙනු කළහැකි අන්තර් පෞද්ගලික නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලීය ජයග්‍රහණ වාර්තාවක් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතුවේ. ප්‍රජාව කෙරෙහි ප්‍රයාපනය ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මකභාවය හා මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඔහු / ඇ වෙත තිබිය යුතුය.

අධ්‍යයන කාර්ය මණ්ඩල පරිමාණයේ ඉහළ වැටුප හා වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් උපකුලපතිවරයාට හිමිවේ.

සියළුම අයදුම්පත් හා නාමයෝජනා සමග පහත සඳහන් ලියකියවිලි එවිය යුතු අතර, විශ්වවිද්‍යාලය පිළිබඳ සිය දැක්ම විධිමත් හෝ අවිධිමත් අයුරින් ඉදිරිපත් කිරීමට අයදුම්කරුගෙන් / නාමයෝජිතයාගෙන් ඉල්ලා සිටීමට පුළුවනි.

01. උපන්දිනය ඇතුළු අයදුම්කරුගේ / නාමයෝජිතයාගේ සම්පූර්ණ ජීවදත්ත.
02. පත්කරගනු ලැබුවහොත් අපේක්ෂකයා විසින්, සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන කරුණු විස්තර කෙරෙන විශ්වවිද්‍යාලය සඳහා වූ දැක්ම අඩංගු පෞද්ගලික ප්‍රකාශයක්
03. නාමයෝජනාවක් සම්බන්ධයෙන් නම් නාමයෝජිතයාගේ එකඟත්වය පළකරන ලිපියක්

04. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය හැර රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට / නාමයෝජිතයන්ට අදාළව ඔහු / ඈ මෙම තනතුර සඳහා පත්කරගතහොත් අයදුම්කරුව මුදවා හැරිය හැකිද යන්න සඳහන් සේවායෝජකගේ ලිපියක්

05. අයදුම්කරු දැනට ධූරය උසුලන්නේනම් ඔහුගේ / ඇයගේ ධූර කාලසීමාවේ ප්‍රථම වාරය තුළදී ඉටුකරන ලද කර්තව්‍යයන් විදහාපාන වාර්තාවක්

අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛවලට අනුකූලව සලකා බැලීම පිණිස, අයදුම්කරුවන් / නාමයෝජිතයින් අතුරින් උසස්ම සුදුසුකම් ලබාගත් අපේක්ෂකයින් තිදෙනෙකුගේ නම් විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ තීරණය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කොළඹ 07, ඇල්බට් චන්ද්‍රවංකයේ, අංක 21 හි පිහිටි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත අයදුම්පත් හා නාමයෝජනා **2014.07.02** දින **ප.ව.4.00 වන විට හෝ එයට පෙර** ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාරදිය යුතුය. අවසාන දිනයට හා වේලාවට පසු ලැබෙන අයදුම්පත් ගැන ක්‍රියා නොකරනු ඇත.

අයදුම්පත් / නාමයෝජනා අඩංගු ලිපිකවරයේ ඉහළ වම් කෙළවරෙහි "උපකුලපති තනතුර" යන්න සඳහන් කළයුතුය.

ලේඛකාධිකාරී,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.
2014.05.23